# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2138/41 - 2019 අගෝස්තු මස 30 වැනි සිකුරාදා - 2019.08.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය* : 6/3/7/15/5/7.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : LD/05/2007/MV/110H.

මොරගහකන්ද/කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර :*

මෙහි මහජන කටයුත්තක් යනු මොරගහකන්ද හා කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම වේ.

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ, නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගගල පල්ලේසිය පත්තුව සුළු කොට්ඨාසයේ තලාගොඩ ග්‍රාම නිලධාරි වසමේ, තලාගොඩ ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක අ.භූ.පි. 17, අතිරේක අංකය 36, පත්‍රය 94 දරන සැළසුමේ පෙන්නුම් කර ඇති පහත සඳහන් ඉඩම් කොටස:

01. **කැබලි අංක 3770**

ඉඩමේ නම: කුඹුක්ගොල්ල; විස්තරය: ලඳු කැලය; හිමිකම් කියන අය: කුඹුක්ගොල්ලයාය, තලාගොඩ හි පදිංචි වීරකෝන් මුදියන්සේලාගේ වීරකෝන් බන්ඩා මයා. (මියගොස්); ප්‍රමාණය: හෙක්. 0.3604.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019 සැප්තැම්බර් මස 25 වැනි දින පෙ.ව. 9.30 ට නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2019 සැප්තැම්බර් මස 18 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ආත්මා දිලුක්ෂි ජයරත්න,
ප්‍රාදේශීය ලේකම්,
නාඋල.

2019 අගෝස්තු මස 28 වැනි දින,
නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09-474